# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


මගේ අංකය / எனது இல. / My Ref. CSS/7/1/3 | ඔබේ අංකය / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2022.03. 07

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (V)

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන්.

**<u>ප්‍රසම්පාදන කමිටු සීමාවන් සංශෝධනය කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ප්‍රසම්පාදන කමිටු සීමා පිළිබඳ 2016.08.24 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016, 2016.12.27 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (I), 2018.11.14 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (II), 2019.01.16 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (III) හා 2020.07.24 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (IV) ට අතිරේක වශයෙනි.

02. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති 2020.03.25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේක 35 මගින් හා 2021.04.21 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේක 38 මගින් ප්‍රසම්පාදන බල අධිකාරි සීමා කිහිපයක් සංශෝධනය කර ඇත. එම අතිරේකයන් පදනම් කරගෙන හා ඒ ඒ බල අධිකාරීන් යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේ දී මුහුණ පෑමට සිදු වී තිබෙන ප්‍රායෝගික දුෂ්කරතාවයන් හා විවිධ අවස්ථාවල සිදු වූ භාණ්ඩ හා සේවාවන්හි වෙළෙඳ පොල මිල ගණන් ඉහළ යාම ආදී කරුණු මත ප්‍රසම්පාදන බල අධිකාරී සීමාවන් සංශෝධනය කර දෙන ලෙස ඉදිරිපත් වූ ඉල්ලීම් අනුව නිරීක්ෂණය වූ කරුණු සලකා බලා ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 හි සඳහන් ප්‍රසම්පාදන කමිටු සීමාවන් පහත පරිදි සංශෝධනය කර 2022.01.01 දින සිට දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/2/6/10 හා 2022.02.22 දිනැති ලිපිය මගින් ලැබී ඇත.

03. එබැවින් පහත සඳහන් ප්‍රසම්පාදන ක්‍රමයන්හි ප්‍රසම්පාදන කමිටු සීමා අනුව ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලෙසත්, මෙහි සඳහන් නියමයන් හා උපදෙස් පිළිපදින ලෙසත්, කාරුණිකව දන්වමි. මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට අයත් සියළුම ආයතන දැනුවත් කරන ලෙස ද වැඩිදුරටත් දැනුම් දෙමි.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

## 1. භාණ්ඩ, වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා වෙළෙඳ පොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීමේ දී (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.4)

මේ සඳහා සැපයුම්කරුවන් විධිමත් ලියාපදිංචි කිරීමක් අවශ්‍ය වන අතර **පළාත් මූල්‍ය රීති 434.1** අනුව ක්‍රියා කළ යුතු ය.

ඉහත මූල්‍ය රීති 434.1 අනුව, තෝරා ගැනීමට ලියාපදිංචි සැපයුම්කරුවන් නොමැති අවස්ථාවල දී හා ලියාපදිංචි සැපයුම්කරුවන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන අවස්ථාවල දී පමණක් ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටුවල ලැයිස්තුගත කර ඇති සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවිය යුතුය.

| බල අධිකාරිය හා කැඳවිය යුතු අවම මිළ ගණන් ප්‍රමාණය | ශ්‍රී ලංකා රජයේ අරමුදල් සපයන ව්‍යාපෘති | |
|---|---|---|
| 10. පළාත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ (ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් 5කට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.මිලියන 3.5 දක්වා | |
| 11. පළාත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව - භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා (ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් 5කට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.මිලියන 3 දක්වා | |
| 11.1. පළාත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව - භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා (ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් 3කට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.මිලියන 2 දක්වා | |
| | ගණකාධිකාරී සේවයේ අනුමත තනතුරක් ඇති ( මූලික රෝහල් හැර) | මූලික රෝහල් හා අනෙකුත් උප කාර්යාල |
| 14. ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ (ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් 5කට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.මිලියන 2 දක්වා | රු.මිලියන 1 දක්වා |
| 15. ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව - භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා (ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් 5කට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.මිලියන 1 දක්වා | රු.500,000 දක්වා |
| 15.1 ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව - භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා (ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් 3කට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.500,000 දක්වා | රු.250,000 දක්වා |

**2. සුළු වටිනාකම් සහිත අලුත්වැඩියා, වැඩ, භාණ්ඩ හා සේවා සෘජු මිලදී ගැනීම් (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 හෝ 3.6) (ශ්‍රී ලංකා රජයේ අරමුදල් හෝ විදේශ අරමුදල් භාවිතා කරන )**

| බල අධිකාරිය | සම්පූර්ණ කළ යුතු කරුණු | අධිකාරි සීමාව |
|---|---|---|
| 9. පළාත් අමාත්‍යාංශ ලේකම්/ ව්‍යාපෘති අධ්‍යක්ෂ | මෝටර් රථ සහ වෙනත් උපකරණ අලුත්වැඩියාව<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායී නොවන විට ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව පළාත් අමාත්‍යාංශ ලේකම්/ ව්‍යාපෘති අධ්‍යක්ෂ සහතික විය යුතුය.<br>• මෙම අධිකාරය පළාත් අමාත්‍යාංශ ලේකම්/ ව්‍යාපෘති අධ්‍යක්ෂ පෞද්ගලික අධීක්ෂණය හා අනුමැතිය සහිතව ක්‍රියාත්මක කළ යුතුය. | රු.500,000 දක්වා |
| 10. පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් | මෝටර් රථ සහ වෙනත් උපකරණ අලුත්වැඩියාව<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායී නොවන විට ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ පළාත් අධ්‍යක්ෂ සහතික විය යුතුය.<br>• මෙම අධිකාරය දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ පළාත් අධ්‍යක්ෂ පෞද්ගලික අධීක්ෂණය හා අනුමැතිය සහිතව ක්‍රියාත්මක කළ යුතුය. | රු.250,000 දක්වා |

04. ඉහත ප්‍රසම්පාදන සීමාවන්ට අමතරව, අනෙකුත් ප්‍රසම්පාදන කටයුතුවල දී උක්ත කරුණු සම්බන්ධයෙන් නිකුත් කරන ලද ප්‍රසම්පාදන කමිටු සීමා පිළිබඳ 2016.08.24 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016, 2016.12.27 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (I), 2018.11.14 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (II), 2019.01.16 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (III) හා 2020.07.24 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (IV) ට අනුව කටයුතු කළ යුතු බව වැඩිදුරටත් දැනුම් දෙමි.

ආර්.සී. ද .සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් - 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත. - දැ.ගැ.ස
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත. - දැ.ගැ.ස

ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ
கலாநிதி டப்லிவ். டப்லிவ். கமகே
Dr. W. W. Gamage
දකුණු පළාත් ආණ්ඩුකාරවර
தென் மாகாண ஆளுநர்
Governor of Southern Province

| මගේ අංකය<br>எனது இல<br>My No. | G/SP/2/6/10 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | CSS/7/3/5/2(v) | දිනය<br>திகதி<br>Date | 2022.02.22 |
|---|---|---|---|---|---|

25 FEB 2022

D/F

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
දකුණු පළාත.

<u>ප්‍රසම්පාදන කමිටු සීමා සංශෝධනය කිරීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක: CSS/7/3/5/2(v) හා 2022.02.17 දිනැති ලිපිය හා බැඳේ.

**02.** ඒ අනුව, ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 හා ඊට අදාළව නිකුත් කරන ලද සංශෝධිත චක්‍රලේඛ මගින් නියම කර ඇති ප්‍රසම්පාදන සීමා, ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වූ අතිරේකයන් අනුව උක්ත ලිපියෙහි සඳහන් සංශෝධනයන් සහිතව ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016(V) යනුවෙන් සංශෝධිත චක්‍රලේඛයක් 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිකුත් කිරීමට මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් අනුමත කරමි.

ආචාර්ය ඩබ්ලිව්.ඩබ්ලිව්.ගමගේ,
ආණ්ඩුකාරවර
දකුණු පළාත

ආචාර්ය ඩබ්ලිව්.ඩබ්ලිව්. ගමගේ
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.

ආණ්ඩුකාරවර කාර්යාලය, ඩික්සන් පාර, ගාල්ල.
දුරකථන : 091 2234578
ෆැක්ස් : 091 2227228
විද්‍යුත් තැපැල : governorsp@sltnet.lk

ஆளுநர் அலுவலகம், கீழ் டிக்ஸன் வீதி, காலி.
தொலைபேசி : 091 2234578
தொலைநகல் : 091 2227228
மின் அஞ்சல் : governorsp@sltnet.lk

Governor's Office, Lower Dickson Rd, Galle.
Tel : 091 2234578
Fax : 091 2227228
E-mail : governorsp@sltnet.lk